54365

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
* එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100**කි.

● අංක **1** සිට **15** තෙක් ඇති ප්‍රශ්න සමන්විත වන්නේ ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාව හා අදාළ ව සපයන ලද ප්‍රකාශ පහකිනි. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

**1.** දේශපාලන විද්‍යාව අධ්‍යයනයේ දී සැලකිලිමත් වන කරුණු වන්නේ:

A - රාජ්‍ය සහ ආණ්ඩුව
B - දේශපාලන බලය
C - පුද්ගලයින්ගේ දේශපාලන චර්යාව
D - ජනතාව, ආණ්ඩුව හා රාජ්‍ය අතර පවත්නා සම්බන්ධතාව
E - ලෞකික ජීවිතයෙන් මිනිසුන් මුදවා ගැනීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**2.** දේශපාලනය:

A - බල අරගලයේ ප්‍රායෝගික ප්‍රකාශනය වේ.
B - දේශපාලන, ආර්ථික හා සමාජ කරුණු පිළිබඳ ව පවතින ප්‍රතිවිරුද්ධ ආශාවන්ගේ ප්‍රතිඵලය වේ.
C - පුද්ගලයින්, දේශපාලනඥයින් සහ දේශපාලන පක්ෂ විසින් කරනු ලබන ක්‍රීඩාවක් වේ.
D - මහත්වරුන්ගේ ක්‍රීඩාවක් ලෙස ද සැලකේ.
E - කාට, කුමක්, කුමන අවස්ථාවක, කෙසේ හිමිවන්නේ ද යන්න තීරණය කෙරෙන ක්‍රීඩාව වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**3.** චර්යාවාදය:

A - නිරීක්ෂණය කළ හැකි මානව චර්යාව පමණක් පදනම් කරගෙන සමාජ න්‍යායන් ගොඩනැගිය යුතු ය යන විශ්වාසය මත ගොඩනගා ඇත.
B - දේශපාලන විද්‍යාව සැලකිලිමත් වන අවසාන අගය කිරීම් සහිත කරුණු අධ්‍යයනය කිරීම සඳහා වඩාත් සැලකිලිමත් විය යුතු බව අවධාරණය කර ඇත.
C - පර්යේෂණ සහ සංඛ්‍යා දත්ත විශ්ලේෂණය කිරීම මගින් ප්‍රමාණීකරණය කළ හැකි දත්ත එක්රැස් කිරීම හා සම්බන්ධ වේ.
D - අනාවැකි පළ කිරීමේ හැකියාව සහිත ප්‍රත්‍යක්ෂ මූලික න්‍යායන් ගොඩනැගීමට උත්සාහ දරා ඇත.
E - සත්‍යතාව පරීක්ෂා කළ හැකි විස්තරාත්මක න්‍යායන් මත විද්‍යාත්මක දැනුම වර්ධනය කළ හැකි බව අවධාරණය කර ඇත.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**4.** රාජ්‍යය:

A - දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජය වේ.
B - ජනතාවගේ සාමූහික කැමැත්ත නියෝජනය කරන ඒජන්තවරයා වේ.
C - දෙවියන් වහන්සේ විසින් නිර්මාණය කළ උසස් ම දේශපාලන සංවිධානය වේ.
D - ස්වාධිපති බලය නමින් හැඳින්වෙන උත්තරීතර බලයේ තනි හිමිකරුවා වේ.
E - භූමිය, ජනගහනය, ආණ්ඩුව හා ස්වාධිපති බලය යන මූලික සාධකවලින් සමන්විත වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[දෙවැනි පිටුව බලන්න.

**5.** ජාතික රාජ්‍යය:

A - සංස්කෘතික විවිධත්වය සහ දේශපාලන අසමගිකම ආරක්ෂා කරන්නා වූ රාජ්‍ය ක්‍රමය ලෙස පොදු පිළිගැනීමට ලක්ව ඇත.
B - පුරවැසිභාවය සහ ජාතිකත්වය සමග සම්බන්ධ දේශපාලන බැඳීම් මත ගොඩනගා ඇති ස්වාධීන දේශපාලන සමාජය වේ.
C - බහුජාතික අධිරාජ්‍ය ක්‍රමයට සහ නාගරික රාජ්‍ය ක්‍රමයට එරෙහි විකල්පයක් ලෙස 16 වන සියවසේ දී පැනනැගුණු රාජ්‍ය ක්‍රමයක් වේ.
D - 'සෑම ජාතියකට ම රාජ්‍යයක් සහ සමස්ත ජාතියට ම එක් රාජ්‍යයක්' යන මූලධර්මය මත ගොඩනැඟී ඇත.
E - අන්තර්ජාතික දේශපාලනයේ මූලික ඒකකය ලෙස පොදුවේ පිළිගනු ලැබේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**6.** ස්වාධිපති න්‍යාය:

A - රාජ්‍යයේ බලය ගැන සලකා බලන න්‍යාය වේ.
B - අනෙක් සමාජ සංවිධාන ඉක්මවා ගිය උත්තරීතරභාවයක් රාජ්‍යයට තිබෙන බව අවධාරණය කර ඇත.
C - රාජ්‍යයේ නීතිවලට සුජාතභාවය සපයනු ලැබේ.
D - ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය හා පැවැත්ම සාධාරණීකරණය කර ඇත.
E - දෙවියන් වහන්සේ දේශපාලන බලයේ ප්‍රධාන මූලාශ්‍රය ලෙස පිළිගෙන ඇත.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**7.** ආණ්ඩුව:

A - රාජ්‍යයේ ස්වාමියා වේ.
B - රාජ්‍යයේ මොළය ලෙස සලකනු ලැබේ.
C - රාජ්‍ය වෙනුවෙන් ස්වාධිපති බලය ක්‍රියාවට නංවන ඒජන්තවරයා වේ.
D - රාජ්‍යයේ ප්‍රායෝගික හස්තය වේ.
E - රාජ්‍යය සහ ජනතාව එකට යා කරන මාධ්‍යය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**8.** ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණ වන්නේ:

A - එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මත ක්‍රියාත්මක වීම
B - විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර බලය බෙදා තිබීම
C - ව්‍යවස්ථාදායකය හා විධායකය මත පතිත වී ඇති අධිකරණයේ ආධිපත්‍යය
D - පාලකයන් ජනතාවට වගකීම
E - කලින් කල පවත්වන තරගකාරී මැතිවරණ මගින් ජනතාව විසින් පාලකයින් තෝරාපත් කිරීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**9.** සමාජවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණ වන්නේ:

A - ආණ්ඩුව එක් පක්ෂයක් මත පමණක් ගොඩනගා තිබීම
B - ඒකබලවාදී පාලන ක්‍රමයක් පැවතීම
C - කොමියුනිස්ට් සමාජ ක්‍රමයක් ගොඩනැගීම සඳහා ක්‍රියා කිරීම
D - සමාජ බහුවිධතාව ප්‍රතික්ෂේප කිරීම
E - තම කැමැත්ත අනුව ආණ්ඩුව වෙනස් කිරීමට ජනතාවට බලය තිබීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**10.** ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ වන්නේ:

A - පැහැදිලි දේශපාලන, ආර්ථික හා සමාජ දර්ශනයක් නොමැති වීම
B - තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමයක් නොමැති වීම
C - අනුග්‍රාහක පත් කිරීම් මත ආණ්ඩුව පැවතීම
D - කලින් කල පවත්වන මැතිවරණ මගින් ජනතාව විසින් පාලකයින් තෝරා ගැනීම
E - පාලකයා විසින් තම අභිමතය පරිදි රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**11.** ඒකීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:

A - මධ්‍යම ආණ්ඩුවේ ආයතන තුළ දේශපාලන බලාධිකාරය ඒකරාශී වීම
B - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය අවධාරිත කරන ලද පළාත් පාලන ආණ්ඩුක්‍රමයක පැවැත්ම
C - ස්වාධිපති බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවේ ඒකාධිකාරීත්වය
D - මධ්‍යම ආණ්ඩුව මගින් පමණක් ජාතියේ ආශාවන් ප්‍රකාශ කිරීම
E - එක් පුරවැසිභාවයක්, නීති ක්‍රමයක්, අධිකරණ ක්‍රමයක් හා සිවිල් සේවයක් පැවැතීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK

54365

**12.** සන්ධීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:

A - එකිනෙකට වෙනස් තල දෙකක ආණ්ඩු පැවැතීම
B - මධ්‍යය හා පරිධිය ස්වාධිපති බලය හවුලේ ක්‍රියාවට නැංවීම
C - පරිධියේ ආණ්ඩු මධ්‍යම ආණ්ඩුවට යටත් වීම
D - මධ්‍යයේ සහ පරිධියේ බලතල, කාර්ය සහ වගකීම් මූලික නීතිය මගින් බෙදාහැර තිබීම
E - මධ්‍යය සහ පරිධිය අතර ඇති වන ආරවුල් විසඳීම සඳහා බේරුම්කරුවකු ලෙස ක්‍රියා කරන ස්වාධීන අධිකරණයක පැවැත්ම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**13.** කැබිනට් ආණ්ඩුක්‍රමයක සත්‍ය විධායකය:

A - ව්‍යවස්ථාදායකය විසින් එහි බහුතර පක්ෂයේ සාමාජිකයින් අතුරෙන් තෝරා පත්කරනු ලැබේ.
B - දේශපාලන විධායකය ලෙස ද හඳුන්වනු ලැබේ.
C - නාමික විධායකයේ නාමයෙන් විධායක කාර්යයන් ක්‍රියාවට නැංවීම පැවරී ඇත.
D - විධායක කාර්යයන් වෙනුවෙන් ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකීමට බැඳී ඇත.
E - ව්‍යවස්ථාදායකය මගින් සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මගින් ඉවත් කළ හැකි ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**14.** ජනාධිපති ආණ්ඩුක්‍රමය:

A - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා යොදා ගැනෙන පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයට ඇති එක් විකල්පයක් වේ.
B - ගොඩනැගී තිබෙන්නේ ව්‍යවස්ථාදායකයට වග නොකියන ජනාධිපති නමින් හඳුන්වන විධායකයක් පදනම් කරගෙන ය.
C - වඩාත් කාර්යක්ෂම නමුත් ප්‍රජාතන්ත්‍රවාදය අඩු ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකේ.
D - ගොඩනැගී තිබෙන මූලික ලක්ෂණයක් වන්නේ ව්‍යවස්ථාදායකය හා විධායක අතර පවතින දුරස්ථ සම්බන්ධතාවයි.
E - ලෝකයට ප්‍රථමවරට හඳුන්වා දුන්නේ 1958 ඩිගෝල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**15.** සිවිල් සමාජය:

A - රාජ්‍යයේ අධිකාරී බලයෙන් ජනතාවගේ සිවිල් බලය වෙන් කර දැක්වීම සඳහා යොදා ගැනෙන සංකල්පය වේ.
B - සමාජයේ ස්වාධීන කණ්ඩායම් හා පෞද්ගලික සංවිධානවල එකතුවෙන් ගොඩනැගී ඇත.
C - ඒකබලවාදී පාලන ක්‍රම තුළ පවා පූර්ණ ක්‍රියාත්මක නිදහස භුක්ති විඳියි.
D - සමාජයේ 'කුඩා හට සේනාංක' ඒකරාශි වීමක් ලෙස ද හැඳින්වේ.
E - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සැලකේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

● අංක **16** සිට **21** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් ඉදිරිපත් කර ඇත. ඒවායින් **එක්** ප්‍රකාශයක් සාවද්‍ය වේ. එම **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**16.** ජාතිකවාදය:

(1) 'දේශපාලන සංවිධාන ව්‍යුහයේ කේන්ද්‍රීය මූලධර්මය ජාතිය වනවා' ය යන විශ්වාසය මත ගොඩනගන ලද දේශපාලන මතවාදයකි.
(2) නූතන ලෝකයේ වර්තමාන තත්ත්වය හැඩගැස්වීම සඳහා බෙහෙවින් ම බලපෑම් කර ඇති වඩාත් බලවත් දේශපාලන මතවාද අතුරෙන් එකකි.
(3) දේශපාලන ජාතිකවාදය හා සංස්කෘතික ජාතිකවාදය යනුවෙන් පැතිකඩ දෙකකින් යුක්ත ය.
(4) 'සෑම ජාතියක් ම ස්වාධීන රාජ්‍යත්වයකට හිමිකම දරනු ලැබේ' යන උපකල්පනය මත පදනම් වී ඇත.
(5) දේශපාලන සංකල්පයක් වන අතර එය පැන නැගුණේ මාක්ස්වාදය, පැසිස්ට්වාදය හා නාසිවාදයට එරෙහිව ය.

**17.** පුරවැසිභාවය:

(1) පුද්ගලයා හා රාජ්‍ය අතර පවතින සම්බන්ධතාව ප්‍රකාශ වන මාධ්‍යය වේ.
(2) රාජ්‍යයේ පූර්ණ සාමාජිකත්වයට හිමිකම් කීම සඳහා තිබිය යුතු මූලික පූර්ව අවශ්‍යතාව වේ.
(3) රාජ්‍යයේ පූර්ණ සාමාජිකයින් ලෙස නොසලකන යටත් වැසියන්ට හා විදේශිකයන්ට හිමි නොවේ.
(4) සම්බන්ධ වන මූලික බැඳීමක් වන්නේ රාජ්‍යයේ පැවැත්ම උදෙසා අවශ්‍ය සමහර යුතුකම් ඉටු කිරීමට පුරවැසියන්ට සිදු වීම ය.
(5) හිමි අයට තම කැමැත්ත අනුව ඕනෑම අවස්ථාවක සියදිවි හානිකර ගැනීමේ අයිතිය හා නිදහස ඇත.

[හතරවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK EXAMMOOD.LK

- පහතින් දක්වා ඇති ප්‍රකාශ පදනම් කරගෙන අංක **45** හා **46** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වශයෙන් වර්ග තුනකින් සමන්විත වේ.
B - 1987 ඉන්දු-ලංකා සාම ගිවිසුමේ කොන්දේසි යටතේ පිහිටුවන ලදී.
C - පළාත් සභාවල අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.
D - එක් පළාතකට එකක් බැගින් පිහිටුවා ඇත.
E - මධ්‍යම ආණ්ඩුව විසින් පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සහ අනෙක් අමාත්‍යවරුන් පත්කරනු ලැබේ.
F - තමන්ගේ බල ප්‍රදේශය තුළ සමාජ ප්‍රයෝජ්‍යතා සේවා සැපයීමේ වගකීම පැවරී ඇත.
G - ප්‍රධාන විධායකය ආණ්ඩුකාරවරයා ලෙස හඳුන්වන අතර ඔහු පත් කරන්නේ ජනාධිපතිවරයා විසිනි.
H - වසර හතරක නිල කාලයක් සඳහා ජනතා ඡන්දයෙන් තේරීපත් වූ සාමාජිකයින්ගෙන් පමණක් සමන්විත වේ.
I - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය පැවරුව ද ස්වාධිපති ආයතන නොවේ.
J - තම අභිමතානුසාරී බලය යොදවමින් ඕනෑම අවස්ථාවක විසුරුවා හැරීමට පළාත් මහ ඇමතිවරයාට හැකියාව ඇත.

**45.** පළාත් සභාවලට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:

(1) ABCD (2) EFGH (3) ABIJ (4) BDGI (5) DEFG

**46.** පළාත් පාලන ආයතනවලට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:

(1) ACDE (2) BEFG (3) ACFH (4) FGHI (5) GHIJ

- පහතින් දැක්වෙන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහ පොදු රාජ්‍ය මණ්ඩලයට අදාළ ප්‍රකාශ කිහිපයකි. එම ප්‍රකාශ අදාළ කරගෙන අංක **47** හා **48** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පුළුල් අරමුණු සහිතව වර්තමාන ලෝකය තුළ ක්‍රියාත්මක වන විශාල ම අන්තර් ආණ්ඩු සංවිධානය වේ.
B - සීමිත අරමුණු සහිත මැදි මට්ටමේ අන්තර් ආණ්ඩු සංවිධානයක් වේ.
C - සාමාජිකත්වය ස්වාධිපති රාජ්‍යවලට පමණක් සීමා වූ ස්වේච්ඡා සංවිධානයක් වේ.
D - ප්‍රධාන අරමුණ වන්නේ ලෝක සාමය හා සුරක්ෂිතතාව ආරක්ෂා කොට පවත්වාගෙන යාම ය.
E - ලෝකයේ ව්‍යවස්ථාවක් නොමැති එකම අන්තර්ජාතික සංවිධානය වේ.
F - සාමාජික රාජ්‍යයවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීමේ මූලධර්මය මත ක්‍රියාත්මක වේ.
G - යුරෝපා සංගමයේ අනුබද්ධ සංවිධානයක් වේ.
H - සමාජීය හා ආර්ථික ක්ෂේත්‍රයන්හි සාමාජිකයින් අතර සහයෝගය වර්ධනය කිරීම සැලකිලිමත් වන ප්‍රධානතම කරුණ වේ.
I - ප්‍රධාන ව්‍යවස්ථාදායක ආයතනය ආරක්ෂක මණ්ඩලය වන අතර එය මහලේකම්වරයාට වගකීමට බැඳී සිටී.
J - 1945 වර්ෂයේ දී පිහිටුවන ලදී.

**47.** එක්සත් ජාතීන්ගේ සංවිධානයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:

(1) ADFJ (2) BEGH (3) CHIJ (4) ADFH (5) AFGH

**48.** පොදු රාජ්‍ය මණ්ඩලයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:

(1) ABCD (2) BCEH (3) DEFG (4) GHIJ (5) DFGH

- අන්තර්ජාතික යුක්ති අධිකරණයට සහ කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික කලාපීය සංවිධානයට (SAARC) අදාළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. එම ප්‍රකාශ පදනම් කරගෙන අංක **49** හා **50** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නීතිමය හස්තය වේ.
B - සීමිත අරමුණු සහිත කලාපීය සංවිධානයක් වේ.
C - සාමාජික රාජ්‍ය අතර නීතිමය ප්‍රශ්න සමථ කිරීමේ බලය හිමි වේ.
D - දකුණු ආසියාතික රාජ්‍ය අටකින් සමන්විත වේ.
E - 1985 ඩකා ප්‍රකාශනය පදනම් කරගෙන පිහිටුවා ඇත.
F - එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා එහි අනුබද්ධිත ආයතනවලට උපදේශන අදහස් සපයනු ලැබේ.
G - ආරක්ෂක මණ්ඩලය සමග එක්ව මහා මණ්ඩලය විසින් පත් කරන විනිශ්චයකරුවන් නව දෙනෙකුගෙන් සමන්විත වේ.
H - අර්බුදකාරී නොවන සහ දේශපාලන නොවන ක්ෂේත්‍රයන්හි සාමාජික රාජ්‍ය අතර සහයෝගය වර්ධනය කිරීම සැලකිලිමත් වන ප්‍රධානතම කරුණ වේ.
I - යුද්ධ අපරාධ සඳහා වැරදිකරුවන් වන අයට මරණ දඬුවම නියම කිරීමේ බලය හිමි වේ.
J - සංවිධානයේ නායකයා ලෙස සාමාජික රාජ්‍ය විසින් ඉන්දියාව පත් කර ඇත.

**49.** අන්තර්ජාතික යුක්ති අධිකරණයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:

(1) ACEF (2) ABDF (3) BEGH (4) ACFG (5) EHIJ

**50.** කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:

(1) AFIJ (2) BDEJ (3) CFGI (4) DHIJ (5) BDEH

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

| | | |
|---|---|---|
| දේශපාලන විද්‍යාව II<br>அரசியல் விஞ்ஞானம் II<br>Political Science II | 23 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

විභාග අංකය: ................................

| | |
|---|---|
| A කොටස | |
| මුළු ලකුණු | 20 |

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් තුනකින් යුක්ත ය.
* **A** කොටස තුළ කෙටි ප්‍රශ්න **20** ක් අන්තර්ගත වේ. සම්පූර්ණ පිළිතුරක් සඳහා ලකුණු **01** ක් ද, අර්ධ පිළිතුරක් සඳහා ලකුණු **1/2** ක් ද හිමි වේ. මෙම කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා **B** හා **C** කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** දේශපාලන ක්‍රීඩාව ක්‍රියාවට නංවන මාර්ග **දෙකක්** තිබේ. එම මාර්ග **දෙක** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

**2.** කරුණු දෙකක් හේතුවෙන් ග්‍රීක පෞර රාජ්‍යයන් තුළ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක ව ක්‍රියාවට නැංවිය හැකි විය. එම කරුණු **දෙක** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

**3.** දේශපාලන විද්‍යාව අධ්‍යයනය විෂයයක් ලෙස හැඩගැස්වීමට සහ වර්ධනයට ග්‍රීක දේශපාලන දාර්ශනිකයින් දෙදෙනකු ප්‍රබල ලෙස දායක විය. එම **දෙදෙනා** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

**4.** (1) පොදු කැමැත්ත සහ (2) නීතියේ ආධිපතිත්වය යන සංකල්ප ක්‍රමවත් ලෙස ඉදිරිපත් කළ දේශපාලන චින්තකයින් **දෙදෙනා** පිළිවෙළින් නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

**5.** (i) "ප්‍රජාතන්ත්‍රවාදය ජනතාවට අයත් ජනතාව විසින් ජනතාව සඳහා ක්‍රියාත්මක වන්නා වූ ආණ්ඩුක්‍රමයක් වේ."

(ii) "නූතන රාජ්‍යයන්හි විධායකය වූ කලී වෙනත් දෙයක් නොව ධනපති පංතියේ කටයුතු කළමනාකරණය කරන කමිටුව වේ."

නූතන රාජ්‍යයන්හි ආණ්ඩු සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති ප්‍රකාශ දෙක ඉදිරිපත් කළ දේශපාලන චින්තකයින් **දෙදෙනා** පිළිවෙළින් නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................



EXAMMOOD.LK EXAMMOOD.LK

6. (i) "විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතාව දුරස්ථ වේ."

(ii) "විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතාව බෙහෙවින් ම සමීප වන අතර එම හේතුවෙන් ආයතන දෙක අතර පවතින්නේ අන්‍යෝන්‍ය රඳා පැවැත්මකි."

ඉහත දක්වා ඇති විධායක-ව්‍යවස්ථාදායක සම්බන්ධතා දැකිය හැකි ආණ්ඩුක්‍රම **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(1) ................................................................................................

(2) ................................................................................................

7. (i) "දේශපාලන බලය අල්ලා ගැනීම ප්‍රධාන අරමුණ වේ."

(ii) "දේශපාලන බලය හසුරුවන අයට බලපෑම් කිරීම මගින් පෞද්ගලික ආශා වර්ධනය කර ගැනීම සැලකිලිමත් වන ප්‍රධාන කරුණ වේ."

ඉහත දක්වා ඇති ප්‍රකාශ දෙකට අදාළ වන සංවිධාන වර්ග **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(1) ................................................................................................

(2) ................................................................................................

8. (i) ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාගේ නිලකාලය සහ එක් පුද්ගලයකුට ජනාධිපති තනතුරට තේරී පත්විය හැකි වාර ගණන කොපමණ ද?

(ii) ප්‍රංශ ජනාධිපතිවරයාගේ නිලකාලය හා එක් පුද්ගලයකුට ජනාධිපති තනතුර දැරිය හැකි වාර ගණන කොපමණ ද?

(1) ................................................................................................

(2) ................................................................................................

9. (i) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙහි දේශපාලන විධායකය නම් කරන්න.

(ii) බ්‍රිතාන්‍යයේ අධිකරණ ව්‍යුහය තුළ ඉහළ ම අධිකරණය නම් කරන්න.

(1) ................................................................................................

(2) ................................................................................................

10. (i) ස්විට්සර්ලන්තයේ සන්ධීය මණ්ඩලයේ (Federal Council) සංයුතිය සහ එම මණ්ඩලයේ සාමාජිකයින් පත්වන ආකාරය දක්වන්න.

(ii) ඉන්දියාවේ මධ්‍ය ආණ්ඩුවේ රාජ්‍ය සභාව නමින් හැඳින්වෙන දෙවන මණ්ඩලය සමන්විත වන්නේ මන්ත්‍රීවරුන් දෙවර්ගයකිනි. එම මන්ත්‍රීවරුන් **දෙවර්ගය** නම් කරන්න.

(1) ................................................................................................

(2) ................................................................................................

11. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන ක්‍රමය යටතේ වාර්ගික නියෝජන ක්‍රමය හඳුන්වා දුන් සහ එම නියෝජන ක්‍රමය අහෝසි කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(1) ................................................................................................

(2) ................................................................................................

12. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඉතිහාසය තුළ සීමිත ඡන්ද බලය හඳුන්වා දුන් සහ සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ **දෙක** පිළිවෙළින් දක්වන්න.

(1) ................................................................................................

(2) ................................................................................................

13. (i) බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයෙන් නිදහස ලබා ගැනීමේ ව්‍යාපාරය දියත් කිරීම සඳහා ලාංකිකයින් විසින් පිහිටුවන ලද ප්‍රථම ජාතික සංවිධානය කුමක් ද?

(ii) ලංකාවේ ප්‍රථම වාමාංශික පක්ෂය නම් කොට එය ආරම්භ කළ වර්ෂය දක්වන්න.

(1) ................................................................................................

(2) ................................................................................................



EXAMMOOD.LK EXAMMOOD.LK

**14.** (i) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව දක්වන්න.

(ii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අමාත්‍යවරුන් පත් කිරීමේ බලය හිමි වූයේ කාට ද?

(1) ..............................

(2) ..............................

**15.** (i) 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රැජිනගේ ලංකා නියෝජිතයා හැඳින්වූ නිලනාමය කුමක් ද?

(ii) 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රැජිනගේ නියෝජිතයා එම තනතුරට පත් කළ ආකාරය දක්වන්න.

(1) ..............................

(2) ..............................

**16.** (i) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය පත් කළ ආකාරය දක්වන්න.

(ii) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නාමික විධායකයේ නිලකාලය කොපමණ ද?

(1) ..............................

(2) ..............................

**17.** (i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නිර්මාණය කළ දේශපාලන විධායකය සමන්විත වන්නේ කොටස් දෙකකිනි. එම කොටස් **දෙක** නම් කරන්න.

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නිර්මාණය කළ දේශපාලන විධායකයේ එක් කොටසක් පාර්ලිමේන්තුව තුළ සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මගින් නිලයෙන් ඉවත් කළ හැකි ය. එම කොටස නම් කරන්න.

(1) ..............................

(2) ..............................

**18.** (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා ස්ථාපිත කරනු ලැබුවේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ කුමන වර්ෂයේ දී ද?

(ii) පළාත් සභාවල ප්‍රධාන විධායකය තනතුර නම් කරන්න.

(1) ..............................

(2) ..............................

**19.** (1) එක්සත් ජාතික පක්ෂය සහ (2) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැගීමේ දී පදනම් කර ගත් දේශපාලන හා ආර්ථික මතවාද නම් කරන්න.

(1) ..............................

(2) ..............................

**20.** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ (1) ප්‍රධාන විධායක නිලධාරියා සහ (2) ප්‍රධාන සාකච්ඡා මණ්ඩලය නම් කරන්න.

(1) ..............................

(2) ..............................

* *

EXAMMOOD.LK EXAMMOOD.LK

EXAMMOOD.LK
EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

54365

**උපදෙස්:**

※ **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

**1.** ඔබ ප්‍රායෝගික දේශපාලනයෙන් න්‍යායාත්මක දේශපාලනය වෙන් කර දක්වන්නේ කෙසේ ද? (ලකුණු 20 යි.)

**2.** පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** විභාග කරන්න.

(i) බලතල බෙදීමේ න්‍යාය හා භාවිතය
(ii) නීතියේ ආධිපතිත්වය
(iii) ව්‍යවස්ථානුකූලවාදය
(iv) අධිකරණ විවරණ බලය (ලකුණු 10 × 2 = 20 යි.)

**3.** පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(i) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම තුළ දේශපාලන පක්ෂවල කාර්යභාරය
(ii) බලපෑම් කණ්ඩායම්වල කාර්යභාරය
(iii) මහජන මතයේ භූමිකාව
(iv) දේශපාලන සමාජානුයෝජනයේ කාරක
(v) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන්හි සිවිල් සමාජයේ භූමිකාව (ලකුණු 10 × 2 = 20 යි.)

**4.** පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳ ව පරීක්ෂා කරන්න.

(i) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙහි මහජන මන්ත්‍රී මණ්ඩලයේ **හෝ** ඇමෙරිකානු ආණ්ඩුක්‍රමයෙහි නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ භූමිකාව
(ii) ප්‍රංශයේ ජනාධිපතිවරයා සහ කැබිනට් මණ්ඩලය අතර පවතින සම්බන්ධතාව **හෝ** ස්විට්සර්ලන්තයේ සන්ධීය මණ්ඩලය (Federal Council) සහ සන්ධීය සභාව (Federal Assembly) අතර පවතින සම්බන්ධතාව
(iii) ඉන්දීය ෆෙඩරල් ක්‍රමයෙහි මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍ය අතර පවතින සම්බන්ධතාව
(iv) අන්තර්ජාතික දේශපාලනයෙහි ක්‍රියාධරයන් සහ ඔවුන්ගේ ක්‍රියාකලාපය **හෝ** රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය (ලකුණු 10 × 2 = 20 යි.)

## C කොටස

**5.** නිදහස් ව්‍යාපාරය තුළ ලංකා ජාතික සංගමයේ භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි.)

**6.** පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** විභාග කරන්න.

(i) ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ විධායක කාරකසභා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය
(ii) සුළු ජන කොටස් සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සැපයූ ආරක්ෂණ
(iii) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් නවාංග
(iv) 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ හඳුන්වා දුන් ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් සම්බන්ධයෙන් සිදු කළ වෙනස්කම් (ලකුණු 10 × 2 = 20 යි.)

[පස්වැනි පිටුව බලන්න.

**7.** පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** විභාග කරන්න.

(i) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මෑතකාලීන ප්‍රවණතා

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් නියෝජන ක්‍රමයේ යහපත් හා අයහපත් අංග ලක්ෂණ

(iii) පූර්ව අධිකරණ විවරණ බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ භූමිකාව

(iv) ශ්‍රී ලංකාවේ පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධතාව

(v) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ (ලකුණු 10 × 2 = 20 යි.)

**8.** පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය

(ii) අන්තර්ජාතික යුක්ති අධිකරණය

(iii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ බලතල හා කාර්යයන්

(iv) පොදු රාජ්‍ය මණ්ඩලය (ලකුණු 10 × 2 = 20 යි.)

* * *

EXAMMOOD.LK EXAMMOOD.LK